නම : ගල්වල පාරේ වරිපනම් අංක 177/9, 177/9ඒ, සහ 177/9 බී ; අව්රුදු 5-40ක්වූ පොල් ගස් 70ක්ද, අව්රුදු 5-10 කොස් ගස් 12ක්ද, අවුරුදු 2-25ක්වූ පුවක් ගස් 220ක්ද, අවුරුදු 10-20 ක්වූ දෙල් ගස් 3ක්ද, අවුරුදු 2-25ක්වූ අඹ ගස් 14ක්ද, අවුරුදු 3-5ක්වූ ගන්දෙල් ගස් 3ක්ද, අවුරුදු 3-20ක්වූ මාර ගස් 2ක්ද, අවුරුදු 3ක්වූ දොඹ ගස් 2ක්ද, අවුරුදු 10ක්වූ රුක්අත්තන ගහක්ද, අවුරුදු 2ක්වූ කොට්ටන් ගහක්ද, අවුරුදු 8ක්වූ කපු ගස් 2ක්ද, අවුරුදු 6ක්වූ ගොඩපර ගසක්ද, අවුරුදු 3ක්වූ කජු ගසක්ද, අවුරුදු 10ක්වූ බෙලි ගස් 2ක්ද, අවුරුදු 8ක්වූ ජම්බෝල ගසක්ද, අවුරුදු 5ක්වූ බිලින් ගසක්ද, අවුරුදු 2ක්වූ ලාවුලු ගසක්ද, අවුරුදු 2-5ක්වූ පරගස් 9ක්ද, අවුරුදු 3ක්වූ දොඩම් ගසක්ද, අවුරුදු 2-5ක්වූ දෙහි ගස් 4ක්ද, අවුරුදු 3ක්වූ සපදිල්ලා ගසක්ද, අවුරුදු 2ක්වූ අනෝදා ගස් 2ක්ද, අවුරුදු 1-5ක්වූ කෝපි පඳුරු 5ක්ද, බම්බු පඳුරු 5ක්ද, උළුසෙවිල්ලපු කපරාදු කරන ලද ගොඩනැගිල්ලක් සහ කෙසෙල් පඳුරු 15ක්ද, තහඩු සෙවිල්ලපු කපරාදුකරන ගොඩනැගිලි 2ක්ද, කපරාදු කරන ලද ලිං 2ක්ද, කපරාදු කරන ලද වැසිකිලියක්ද, තහඩු සෙවිල්ලපු කපරාදු කරන ලද වැසිකිළියක්ද මෙම ඉඩමේ තිබෙත් ; අයිතිකම්කියනු ලබන අය : ලත්පඳුරගේ ජෝන් පෙරේරා නෝනා මහත්මය, 37 හිල් වීදිය, දෙහිවල : ප්‍රමාණය : අ. 1, රූ. 1, ප. 09.6.

**කැබැල්ල : 6.**

නම : ගල්වල පාරේ වරිපනම් අංක 179/7 ; විස්තරය : අවුරුදු 3-40ක්වූ පොල් ගස් 128ක්ද, අවුරුදු 3-10ක්වූ පුවක් ගස් 20ක්ද, කොස් ගස් 78ක්ද, අවුරුදු 3-10ක්වූ දෙල් ගස් 6ක්ද, අවුරුදු 3-10ක්වූ හල්මිල්ල ගස් 5ක්ද, අවුරුදු 2ක්වූ කජු ගස් 2ක්ද, අවුරුදු 2-5ක්වූ දොඩම් ගස් 8ක්ද, අවුරුදු 2-5ක්වූ දෙහිගස් 4ක්ද, අවුරුදු 2-5ක්වූ පේරගස් 16ක්ද, අවුරුදු 2-5ක්වූ ජම්බෝල ගස් 3ක්ද, අවුරුදු 2-5ක්වූ උගුරැස්ස ගස් 3ක්ද, අවුරුදු 2-5ක්වූ ලාවුලු ගස් 2ක්ද, අවුරුදු 2-5ක්වූ වෙරළු ගස් 3ක්ද, අවුරුදු 10ක්වූ තේක්ක ගසක්ද, අවුරුදු 15ක්වූ කොට්ටන් ගසක්ද, අවුරුදු 2ක්වූ අඹ ගසක්ද, අවුරුදු 5ක්වූ බිලින් ගසක්ද, අවුරුදු 20ක්වූ නන්නන් ගසක්ද, අවුරුදු 5ක්වූ කාරන් ගස්ක්ද, අවුරුදු 2-5 කෝපි පඳුරු 10ක්ද, අන්නාසි පඳුරු 20ක්ද, කෙසෙල් පඳුරු 27ක්ද, පොල් අතු ගොඩනැගිල්ලක්ද, පොල් අතු මැටි ගොඩනැගිලි 2ක්ද, කපරාදු කරන ලද ළිඳක්ද වත්තේ තිබෙත් ; අයිතිකම්කියනු ලබන අය : ජයතිලක විජේතුංග, පනාලිය, පොල්ගහවෙල ; ප්‍රමාණය : අ. 1, රූ. 1, ප. 39.2.

**කැබැල්ල : 7.**

නම : ගල්වල පාරේ වරිපනම් අංක 195/3 ; විස්තරය : අවුරුදු 2-40ක්වූ පොල් ගස් 83ක්ද, අවුරුදු 15-40ක්වූ කොස් ගස් 11ක්ද, අවුරුදු 2-20ක්වූ පුවක් ගස් 85ක්ද, අවුරුදු 5-30ක්වූ අඹ ගස් 18ක්ද, අවුරුදු 30ක්වූ තේක්ක ගස් 3ක්ද, අවුරුදු 10ක්වූ ගොඩපර ගස් 3ක්ද, අවුරුදු 10ක්වූ හල්මිල්ල ගස් 2ක්ද, අවුරුදු 15-20ක්වූ වා ගස් 5ක්ද, අවුරුදු 10ක්වූ බිලින් ගස් 2ක්ද, අවුරුදු 2-8ක්වූ අනෝද ගස් 3ක්ද, අවුරුදු 15ක්වූ ගන්දෙල් ගසක්ද, අවුරුදු 10ක්වූ වල්කොහොඹ ගසක්ද, අවුරුදු 20ක බෙලි ගසක්ද, අවුරුදු 10ක මිල්ල ගසක්ද, අවුරුදු 15ක දවට ගසක්ද, ඇට්ටේරිය ගසක්ද, මොර ගසක්, වෙලන් ගසක්, ඇම්බුල්ල ගසක්, කහට ගසක් සහ අවුරුදු 10ක කැන්ද, ගසක්ද, අවුරුදු 20ක දිවුල් ගසක්ද, දොඹ ගසක්, උගුරැස්ස ගසක් සහ අවුරුදු 10ක ජම්බෝල ගසක්ද, අවුරුදු 2-5ක්වූ කෝපි පඳුරු 50ක්ද, උණ පඳුරක්ද, පොල් අතු සෙවිලි ගොඩ නැගිල්ලක් සහ ළිඳක්ද සහිත ඉඩම ; අයිතිකම්කියනු ලබන අය : බෙලිගහගේ දෝනා ලියනෝරා ලමාප්පුගේ ඇලක්සැන්ඩර් පෙරේරා, දොන් ඇලක්සැන්ඩර් කොතලාවල සහ හෙනරත් මොහොට්ටිගේ ආතර් පෙරේරා සියල්ලෝම පදිංචිය දෙහිවල ගල්වල පාරේ 195/3 ; ප්‍රමාණය : අ. 1, රූ. 1, ප. 06.9.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960ක්වූ ඔක්තෝබර මස 10 වෙනි දින පෙරවරු 10.30 ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1960ක්වූ සැප්තැම්බර් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ලූඩිකන්ස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්තතුමා.

වර්ෂ 1960 ක්වූ අගෝස්තු මස 20 දින,
කොළඹ කච්චේරියේදීය.

---

අංකය : ආර්/කිව් 231.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත 1950ගේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්ම : ඒ. 4535

පිහිටීම : කොළඹ නාගරිකය තුළ මට්ටක්කුලිය අංක 1 දරණ කොට්ඨාශය.

**කැබැල්ල : 1.**

නම : මට්ටක්කුලිය පල්ලිය පාරේ වරිපනම් අංක 141 දරණ ස්ථාන යෙන් කොටසක් ; විස්තරය : අවුරුදු 40ක්වූ පොල් ගස් 14ක් ද, අවුරුදු 25ක්වූ බෙලි ගසක් ද, අවුරුදු 5ක්වූ අඹ ගස් 2ක් ද, අවුරුදු 3ක්වූ පැපොල් ගස් 2ක් ද, අවුරුදු 2ක්වූ මුරුංගා ගසක් ද, අවුරුදු 5ක් වූ තේක්ක ගසක් ද, පොල් අඩමේ තිබෙත් ; අයිතිකම් කියනු ලබන අය : වාසල මුදලි වික්ටර් එඩ්මන්ඩ් වින්සන්ට් ද සිල්වා, 147, මට්ටක්කුලිය පල්ලිය පාර, කොළඹ ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 2.22.

**කැබැල්ල : 2.**

නම : මට්ටක්කුලිය පල්ලිය පාරේ වරිපනම් අංක 141 දරණ ස්ථාන යෙන් කොටසක් ; විස්තරය : අවුරුදු 5-40 ක්වූ පොල් ගස් 18ක් ද, අවුරුදු 2-50ක්වූ අඹ ගස් 2ක් ද, අවුරුදු 3ක්වූ මුරුංගා ගස් 5ක් ද, අවුරුදු 5ක්වූ කෝපි පැලයක් ද, අවුරුදු 2ක්වූ පැපොල් ගස් 2ක් ද, පොල් ඉඩමේ තිබෙත් ; අයිතිකම් කියනු ලබන අය : සිසිල් වී. ද සිල්වා, සැවොයි නෘත්‍යශාලාව, වැල්ලවත්ත ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 4.57.

**කැබැල්ල : 3.**

නම : මට්ටක්කුලිය පල්ලිය පාරේ වරිපනම් අංක 141 දරණ ස්ථාන යෙන් කොටසක් ; විස්තරය : අවුරුදු 3-40ක්වූ පොල් ගස් 18ක් ද, අවුරුදු 25ක්වූ අඹ ගස් 3ක් ද, අවුරුදු 2ක්වූ පැපොල් ගසක් ද පොල් ඉඩමේ තිබෙත් ; අයිතිකම් කියනු ලබන අය : එච්. ඊ. වී. ද සිල්වා, බගතලේ පාර, කොළඹ ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 2.74.

**කැබැල්ල : 4.**

නම : මට්ටක්කුලිය පල්ලිය පාරේ වරිපනම් අංක 141 දරණ ස්ථාන යෙන් කොටසක් ; විස්තරය : අවුරුදු 2-40ක්වූ පොල් ගස් 14ක් ද, අවුරුදු 50ට වැඩි කොස් ගසක් ද, අවුරුදු 10ක්වූ කිතුල් ගසක් සහ අඹ ගසක් ද, පොල් ඉඩමේ තිබෙත් ; අයිතිකම් කියනු ලබන අය : කඳානේ, රූත් සිල්වා රාමනායකගේ උරුමක්කාරයෝ ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 3.36.

**කැබැල්ල : 5.**

නම : මට්ටක්කුලිය පල්ලිය පාරේ වරිපනම් අංක 141 දරණ ස්ථාන යෙන් කොටසක් ; විස්තරය : අවුරුදු 5-40ක්වූ පොල් ගස් 19ක් ද, කප්පාදු කරන ලද ගේට්ටු කුලුණු 2ක් සහ ගේට්ටුවේ බිත්ති 2ක් ද පොල් ඉඩමේ තිබෙත් ; අයිතිකම් කියනු ලබන අය : ක්ලැරිස් මේරි ජේන් ද සිල්වා, අංක 41, සාන්ත මේරි පාර, කොළඹ ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 3.34.

**කැබැල්ල : 6.**

නම : මට්ටක්කුලිය පල්ලිය පාරේ වරිපනම් අංක 141 දරණ ස්ථාන යෙන් කොටසක් ; විස්තරය : අවුරුදු 2-40ක්වූ පොල් ගස් 14ක් ද, අවුරුදු 5ක්වූ කිතුල් ගසක් ද පොල් ඉඩමේ තිබෙත් ; අයිතිකම් කියනු ලබන අය : වාසල මුදලි වික්ටර් එඩ්මන්ඩ් වින්සන්ට් ද සිල්වා, 147, මට්ටක්කුලිය පල්ලිය පාර, කොළඹ, සී. වී. ද සිල්වා, සැවොයි නෘත්‍ය ශාලාව, වැල්ලවත්ත, එච්. ඊ. වී. ද සිල්වා, බගතලේ පාර, කොළඹ, කඳානේ රූත් සිල්වා, රාමනායකගේ උරුමක්කාරයෝ ක්ලැරිස් ඇම්. ජේ. ද සිල්වා, නො. 41, සාන්ත මේරි පාර, කොළඹ, ඊ. වී. ආර්. සමර වික්‍රම, ඊ. ඩී. සමරවික්‍රම, ඇන්. ඇම්. ඇම්. සිල්වා නොහොත් සමර වික්‍රම, ඇම්. ඊ. සී. අබේසුන්දර නොහොත් සමරවික්‍රම, ජී. ටී. සමර වික්‍රම, ජේ. ඒ. සමරවික්‍රම, ඇන්. ජේ. බී. සමරවික්‍රම සහ ඒ. සී. සමර වික්‍රම, සියළුදෙනාම පදිංචිය " ග්‍රේස්හැම් ", අංක 5, කේම්බ්‍රිජ් පෙදෙස, කොළඹ ; ප්‍රමාණය : අ. 1, රූ. 1, ප. 17.32.

**කැබැල්ල 7.**

නම : මට්ටක්කුලිය පල්ලිය පාරේ වරිපනම් අංක 141 දරණ ස්ථානයෙන් කොටසක් ; විස්තරය : අවුරුදු 2-40 ක්වූ පොල් ගස් 110ක් ද, අවුරුදු 50ක්වූ කොස් ගස් 2ක් ද, අවුරුදු 5ක්වූ තේක්ක ගසක් ද, අවුරුදු 12ක්වූ බෙලි ගසක් ද, අවුරුදු 25ක්වූ උණ පඳුරක් ද, පොල් අතු හෙවිල්ලපු වරිච්චියෙන් තනන ලද පැලක් ද පොල් ඉඩමේ තිබෙත් ; අයිතිකම් කියනු ලබන අය : ඊ. වී. ආර්. සමරවික්‍රම, ඊ. ඩී. සමරවික්‍රම, ජී. ටී. සමරවික්‍රම, ජේ. ඒ. සමරවික්‍රම, ඇන්. ජේ. බී. සමර වික්‍රම, ඒ. සී. සමරවික්‍රම, ඇන්. ඇම්. ඇම්. සිල්වා නොහොත් සමර වික්‍රම සහ ඇම්. ඊ. සී. අබේසුන්දර නොහොත් සමරවික්‍රම, සියලුදෙනා ගේම පදිංචිය " ග්‍රේස්හැම් ", නො. 5, කේම්බ්‍රිජ් පෙදෙස, කොළඹ ; ප්‍රමාණය : අ. 1, රූ. 2, ප. 36.45.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටිනා සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960ක්වූ ඔක්තෝබර් මස 7 වැනි දින පෙරවරු 10ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1960ක්වූ සැප්තැම්බර් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ලුඩිකන්ස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්තතුමා.

වර්ෂ 1960ක්වූ අගෝස්තු මස 20 වැනි දින
කොළඹ කච්චේරියේදිය.

අංකය : ආර්/කිච්. 212.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950යේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950යේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

මූලික සැලැස්ම : ඒ. 4442 ; පිහිටීම : අඹතලෙන් පහළ කොලොන්නාවේ පළාත් ආණ්ඩු සභාවේ සීමාව තුළ සාලේමුල්ල අංක 2 දරණ කොට්ඨාශය, එගොඩ කොලොන්නාව.

**කැබැල්ල : 1.**

නම : කෝන්ගහවත්ත, කැප්පෙටිපොල මාවත, වරිපනම් අංක 33/3 ; විස්තරය : අවුරුදු 30ක කොස් ගසක් ද, තහඩු හෙවිල්ලපු ලැලි ගොඩනැගිල්ලක් ද, තාවකාලික වැසිකිලියක් ද වත්තේ තිබෙත් ; අයිතිකම් කියන අයගේ නම : ඒ. සුමනාවතී සිල්වා, අංක 33, කැප් පෙටිපොල මාවත, වැල්ලම්පිටිය ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 21.0.

**කැබැල්ල : 2.**

නම : කෝන්ගහවත්ත, කැප්පෙටිපොල මාවත, වරිපනම් අංක 31/1 ; විස්තරය : අවුරුදු 15-20ක්වූ පොල් ගස් 17ක් ද, අවුරුදු 5ක්වූ පුවක් ගස් 9ක් ද, අවුරුදු 25ක්වූ කොස් ගස් 3ක් ද, අවුරුදු 10ක්වූ කිතුල් ගස් 3ක් ද, හෙවිල්ලපු වරිච්චි ගොඩනැගිල්ලක්ද වත්තේ තිබෙත් ; අයිතිකම් කියන අය : ඩබ්ලිව්. දාබරේ, ගුණවතී දබරේ, විමලාවතී දාබරේ, නෝර්මන් දාබරේ, සිරියාවතී දාබරේ, නන්දාවතී දාබරේ, ගුණපාල දාබරේ, සියල්ලෝම 31/1, කැප්පෙටිපොල මාවත, වැල්ලම් පිටිය, ඇග්නස් දාබරේ, 53/9, කුප්පියාවත්ත, මරදාන, බෙම්පි දාබරේ නෝනා මහත්මිය, සාලමුල්ල, වැල්ලම්පිටිය ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 1.9.

**කැබැල්ල : 3.**

නම : කෝන්ගහවත්ත (වරිපනම් අංකයක් නැත) ; විස්තරය : වත්ත වැව්ලිකර නැත) ; අයිතිකම් කියන අය : එච්. බ්‍රිම්පි දාබරේ, 31, කැප්පෙටිපොල මාවත, වැල්ලම්පිටිය, වයිමන් දාබරේ, විමලාවතී දාබරේ, නෝර්මන් දාබරේ, සිරියාවතී දාබරේ, නන්දාවතී දාබරේ, ගුණපාල දාබරේ, 31/1, කැප්පෙටිපොල මාවත, වැල්ලම්පිටිය, ඇග්නස් දාබරේ, 53/9, කුප්පියාවත්ත, මරදාන, බෙම්පි දාබරේ නෝනා, සාලමුල්ල, වැල්ලම්පිටිය, ජී. ඩී. ඔබියස් සිඤ්ඤෝ, 24 බී. ආණ්ඩුවේ නිවාස, වැල්ලම්පිටිය, ඒ. සුමනාවතී සිල්වා, 33/3, කැප්පිටිපොල මාවත, වැල්ලම්පිටිය සහ එච්. නෝනෝහාමි, 33, කැප්පෙටිපොල මාවත, වැල්ලම්පිටිය ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 3.7.

**කැබැල්ල : 4.**

නම : කෝන්ගහවත්ත, වරිපනම් අංක 33/6, කැප්පෙටිපොල මාවත ; විස්තරය : අවුරුදු 20ක්වූ පොල් ගස් 5ක් ද, කොස් ගස් 9ක් ද, සියඹලා ගස් 2ක් ද, බෙලි ගස් 4ක් ද, මූනමල් ගස් 2ක් ද, මිල්ල ගස් 2ක් ද, කපරාදුකර තනන ලද උළු හෙවිල්ලපු ගොඩනැගිල්ලක් ද, පොල්වත්තේ තිබෙත් ; අයිතිකම් කියන අයගේ නම : ජී. ඩී. ඔබියස් සිංඤෝ, 36, කහටගහවත්ත, ගොතටුව ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 1.2.

**කැබැල්ල : 5.**

නම : කෝන්ගහවත්ත, වරිපනම් අංක 33/5, කැප්පෙටිපොල මාවත ; විස්තරය : අවුරුදු 20ක්වූ පොල් ගස් 14ක් ද, කොස් ගස් 8ක් ද, මිල්ල ගස් 2ක් ද, කොහොඹ ගසක් ද, අඹ ගස් 2ක් ද, තාව කාලික වැසිකිලියක් ද පොල්වත්තේ තිබෙත් ; අයිතිකම් කියන අය ගේ නම : එච්. නෝනොහාමි, 33, කැප්පෙටිපොල මාවත, වැල්ලම් පිටිය ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 1.8.

**කැබැල්ල : 6.**

නම : දෙල්ගහවත්ත, වරිපනම් අංක 33/1 ඒ, කැප්පෙටිපොල මාවත ; විස්තරය : අවුරුදු 40ක්වූ කොස් ගස් 8ක් ද, පොල් ගස් 13ක් ද, අඹ ගස් 3ක් ද, අවුරුදු 10ක්වූ කිතුල් ගසක් ද, පොල් ගස් 5ක් ද, උළු හෙවිල්ලපු කපරාදු කරන ලද ගොඩනැගිල්ලක් සහ ළිඳක් ද පොල් වත්තේ තිබෙත් ; අයිතිකම් කියන අයගේ නම : ජී. ඩී. බාරොන් සිඤ්ඤෝ, 33, කැප්පෙටිපොල මාවත, වැල්ලම්පිටිය ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 23.2.

**කැබැල්ල : 7.**

නම : දෙල්ගහවත්ත (වරිපනම් අංකයක් නැත) ; විස්තරය : අවුරුදු 15-20ක්වූ කොස් ගස් 2ක් ද, කිතුල් ගසක් ද වත්තේ තිබෙත් ; අයිතිකම් කියන අයගේ නම් : ජී. ඩී. බාරොන් සිඤ්ඤෝ, 33/5, කැප්පෙටිපොල මාවත, වැල්ලම්පිටිය, එච්. බ්‍රිම්පි දාබරේ, 31, කැප්පෙටිපොල මාවත, වැල්ලම්පිටිය ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 1.7.

**කැබැල්ල : 8.**

නම, දෙල්ගහවත්ත, වරිපනම් අංක 33/6, විජය පාර ; විස්තරය : අවුරුදු 30ක්වූ කොස් ගස් 6ක් වත්තේ තිබේත් ; අයිතිකම් කියන අයගේ නම : එච්. බුම්පි දාබරේ, 31, කැප්පෙටිපොල මාවත, වැල්ලම්පිටිය ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 23.3.

**කැබැල්ල : 9.**

නම : දෙල්ගහවත්ත, වරිපනම් අංක 21, විජය පාර ; විස්තරය : අවුරුදු 5ක්වූ පොල් ගස් 3ක්ද, අවුරුදු 40ක්වූ සියඹලා ගසක් සහ බෙලි ගසක්ද, කපරාදු කර තනන ලද පොල් අතු හෙවිල්ලපු ගොඩ නැගිල්ලක්ද වත්තේ තිබේත් ; අයිතිකම් කියන අයගේ නම : ඇම්. ලිලී පෙරේරා, 18, විජය පාර, වැල්ලම්පිටිය ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 29.7.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960ක්වූ ඔක්තෝබර් මස 12 වැනි දින පෙරවරු 10ට කොළඹ කච්චේරියේ දී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960ක්වූ සැප්තැම්බර් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ලුඩිකන්ස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්තතුමා.

වශී 1960ක්වූ අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ කච්චේරියේදීය.

---

ඇල්එච්/ඒ 4057.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

මූ. සැ. නො. ඒ. 4,530—බස්නාහිර පලාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ, එලිවිල ගම.

**කැබලි නො. 1.**

නම : ගොඩපොරගහවත්ත ; විස්තර : අවුරුදු 25-30ක පොල් ගස් 3, අවුරුදු 20-25 අඹ ගස් 1, උළු සෙවිළි කළ බදාමෙන් තැනූ ගොඩ නැගිලි එකක් සහ තහඩු ගැසූ වහළය සහිත බදාමෙන් තැනූ වැසිකිළියක්ද ඇති ඉඩම ; අයිතිකරුවෝ : කහවලගේ ඊබට් පෙරේරා මහත්මයා, වදුරමුල්ල, පානදුර ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 10.6.

**මුළු ගණන : අ. 0, රූ. 0, ප. 10.6.**

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 සැප්තැම්බර් 29 වැනි දින පූර්වභාග 10ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960.10.13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිත වූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

කේ. බී. දිසානායක,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1960ක්වූ අගෝස්තු මස 12 වැනි දින,
කළුතර කච්චේරිය.

---

අංකය : ඇල්එච්/ඒ. 2071.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

මූලික සැ. නො. ඒ. 4524 කැ. නො. 1 සහ 2—බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, කුඹුකෙ පත්තුවේ, හොරණ නගර සභා සීමාව තුළ, වෝඩ් නො. 3, මූනගම, මූනගම නම් ගමෙන් (කොටස) පිහිටි ඉඩම්.

**කැබැල්ල : 1.**

ඉඩමේ නම : දික්හේන වත්ත, රත්නපුර පාරේ වරිපනම් අංක 518න් කොටසක් ; විස්තර : අවු. 4ක් වයසැති බඩ් රබර් ගස් 694 ; අයිතිකරුවෝ : ජේ. ඇල්. ඩී. පීරිස්, නො. 23, ස්වේපල් වීථිය, කොළඹ ; ප්‍රමාණය : අ. 4, රූ. 0, ප. 00.7.

**කැබැල්ල : 2.**

ඉඩමේ කම : දික්හේන වත්ත, රත්නපුර පාරේ වරිපනම් අංක 518න් කොටසක් ; විස්තර : කොටසක් රබර් වගාව (වැවිල්ලක් නැහැ) ; අයිතිකරුවෝ : ජේ. ඇල්. ඩී. පීරිස් නො. 23, ස්වේපල් වීථිය, කොළඹ ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.1.

**මුළු ගණන : අ. 4, රූ. 0, ප. 01.8.**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960.11.8 වැනි දින පූර්වභාග 10.30ට හොරණ ආදායම් පාලක කාර්යාලයයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960.10.31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

කේ. බී. දිසානායක,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1960ක්වූ අගෝස්තු මස 16 වැනි දින,
කළුතර කච්චේරිය.

---

අංකය : ඇල්. ඩී. බී./20.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ පල්ලේගම්පහ කෝරලේ කැන්දේලියද්ද ගමේ පිහිටි, ජම්බුගස්පිටියේ පරණගම පදිංචි පී. බී. පරණකුරුව, පී. ආර්. ඇම්. බිසෝමැණිකේ, පී. ආර්. ඇම්. අප්පුහාමි, පී. ආර්. ඇම්. පළිගුමැණිකේ, පී. ආර්. ඇම්. උක්කුමැණිකේ, පී. ආර්. ඇම්. ප්‍රේමාවතී කුමාරිහාමි, පී. ආර්. ඇම්. කොයින්මැණිකේ, පී. ආර්. ඇම්. විජේරත්න සහ පී. ආර්. ඇම්. කළුබණ්ඩා යන අය විසින් අයිතිවාසිකම් කියනු ලබන මූලික සිතියම් අංක ඒ. 2,701, කැබලි 1 සහ 2 වශයෙන් මැන, විස්තර කර ඇති කොස්කබල හින්න නමැති අක්කර 3, රූඩ් 2, පර්චස් 20.4ක්වූ ඉඩම.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 සැප්තැම්බර් 29 වැනි දින පූර්වභාග 10ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 සැප්තැම්බර් 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඊ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1960 අගෝස්තු මස 13 වැනි දින,
මහනුවර කච්චේරිය.

මගේ අංකය : 3/40/181.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත වූ 1950යේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත වූ 1950යේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

ප්ලෑන අංක ඒ. 2,695 දරණ මූලික පිඹුර. ගම—වරකාමුර

**බිම් කට්ටිය : 1.**

**ඉඩමේ නම :** ගොරකගහමූලවත්ත ; විස්තර : අවුරුදු 50 ට වැඩි තේ ; අයිතිකම් කියන්නා : උකුවෙල, උකුවෙල වත්තේ ජේ. ඊ. ගුණසේන; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 0.2

**එකතුව: අ. 0, රූ. 1, ප. 0.2.**

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 ඔක්තෝබර් 10 වැනි දින පූ. භා. 10 ට මාතලේ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1960 ඔක්තෝබර් 3 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම්දිය යුතුයි.

එන්. ඩබ්ලිව්. එච්. ඩී. ගුණරත්න,
මාතලේ දිස්ත්‍රික්කයේ රජයට ඉඩම් ගන්නා නිලධාරී.

1960 අගෝස්තු 12 වැනි දින,
මාතලේ කච්චේරිය.

---

මගේ අංකය : ඇල්. ඒ./බී. 13.

## 1954රේ අංක 39 දරණ සංශොධිත ආඥාපණතින් සංශොධනයවූ 1950යේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 31 දරණ වගන්තිය යටතේ වූ දැන්වීමයි

ගාලු දිස්ත්‍රික්කයේ, ඉඩම් ආණ්ඩුවට ලබාගැනීමේ නිලධාරී තැන්පත් නෙවිල් ඩේවිඩ් ජයවීර වන මම 1954රේ අංක 39 දරණ සංශොධිත ආඥාපනතින් සංශොධනය වූ 1950යේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 31 වැනි වගන්තිය යටතේ, පහත සඳහන් උප ලේඛනයේ විස්තර කර ඇති ඉඩම් රජයට ලබාගැනීම සඳහා ගෙවිය යුතු වන්දි මුදලවූ රුපියල් 25 අයිතිකරුවන්ට ලබාගැනීම පිණිස, ගාල්ලේ රික්වෙස්ට් උසාවියේ අංක 31,878 දරණ නඩුවට තැන්පත් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

එන්. ඩී. ජයවීර,
ගාලු දිස්ත්‍රික්කයේ ඉඩම් ආණ්ඩුවට ලබාගැනීමේ නිලධාරී.

1960 අගෝස්තු මස 10 වැනි දින,
ගාල්ලේ දිසාපති කායඊලයේදීය.

උපලේඛනය

ඉඩමේ විස්තර :—

**ඉඩමේ නම :** දෙල්ගහවත්ත ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.9 ; පිහිටීම : ගාළු දිස්ත්‍රික්කයේ, කඩවත් සතරේ, පෝද්දල ගම ; සැලැස්මේ අංකය : ඒ 1,328 මූලික සැලැස්ම ; කැබලි අංකය : 2.

---

සඳහන් අංකය : එල්. ඩී. 2424—ජේ. 58/59 එච්.ඒ. 688.

## 1954 රේ අංක 39 දරණ ඉඩම් රජයට අත්කරගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

**7 වැනි වගන්තිය යටතේ දන්වීමයි**

මහාජන කායඊයක් සඳහා අවශ්‍ය තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුවට අත්කර ගෙන ඇති බව 1954 රේ අංක 39 දරණ ඉඩම් රජයට අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගෙන ඇති ඉඩමේ විස්තර :—

සැලැස්ම අංකය : මූලික සැලැස්ම : ඒ 1,791.

**කැබැලි අංකය : 1**

ඉඩමේ නම : වේරගම්පිට පන්සල පාරේ වරිපනම් අංක 6 දරණ ගජමන්ගෙවත්ත නොහොත් මාදංගහවත්ත ; ඉඩමේ විස්තරය : අවු. 25-30 වයසැති පොල් ගස් 388 ක්ද, අවු. 5-10 වයසැති පොල් ගස් 15 ක්ද, අවු. 15 ක් වයසැති කොස් ගසක්ද, අවු. 15 වයසැති දෙල් ගසක්ද, අවු. 15ක් වයසැති මුරුංගා ගසක්ද, අවු. 15ක් වයසැති බෙලි ගසක්ද අවු. 10ක් වයසැති ගොරක ගසක්ද, අවු. 15ක් වයසැති දවට ගසක්ද, ගඩොල් බැම්මෙන් තැනූ උළුසෙවිලි-කළ සවිර ගොඩනැගිලි 5 ක්ද, ලෑලි ගැසූ අර්ධ-සවිර ගොඩනැගිල්ලක්ද, සවිර වැසිකිළි 2 ක්ද, බැම්මෙන් තැනූ ළිං 2 ක්ද, සවිර මලසූත් ගෙයක්ද සහිත පොල් ඉඩම; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: එඩ්මන්ඩ් සමරසේකර මහතා, " මානෙල් ", වල්පොල, මාතර ; බිම් ප්‍රමාණය : අ. 3, රූ. 2, ප. 09.1.

ඉහත සඳහන් ඉඩම මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර තුළ, මාතර නගර සීමාවේ අංක 4 දරණ වේරගම්පිට ඡන්ද කොට්ඨාශයේ පිහිටා තිබේ.

අත්කර ගෙන ඇති ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960 සැප්තැම්බර් මස 30 වැනි දින පෙ.ව. 9.30 ට මාතර කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද, 1960 සැප්තැම්බර් මස 21 වැනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දන්වීමකින් ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනීසිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් හෝ මට ලියා දන්විය යුතුයයි ද නියම කරමි.

තම තමන්ගේ අයිතිවාසිකම් හා ඉල්ලා සිටින වන්දි මුදල් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියලු ඔප්පු තිරප්පු හා අනික් ලියවිලි ද පරීක්ෂණයේ දී මට ඉදිරිපත් කළ යුතුයි.

එච්. ආර්. අමිත්,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

මාතර කච්චේරිය,
1960 අගෝස්තු මස 12 දාය.

---

සඳහන් අංකය : එල්. එච්. 803.

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිතවූ 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

මහාජන කායඊයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිතවූ 1950යේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර :—

පිහිටීම: කෑගල්ල දිස්ත්‍රික්කයේ අටුළුගම් පනාවල් දෙකෝරළේ පනාවල් කෝරළේ නැගෙනහිර, හිඟුලෙ කන්ද ගම. ප්ලෑනේ අංකය: පී.පී.ඒ. 1,008 ;

**බිම්කට්ටි අංකය : 1.**

ඉඩමේ නම : හත්නාගල වත්තේ නවගමුකන්ද හේන්යාය ; විස්තර : ලඳු කැලෑව ; අයිතිකම් කියන අය : ඇහැලියගොඩ, පනාවල පී. කරලියප්පන් ; ප්‍රමාණය : අ. 22, රූ. 0, ප. 15.

**බිම්කට්ටි අංකය ; 2.**

ඉඩමේ නම : පඹේගම වත්ත ; විස්ත ; ලඳු කැලෑව ; අයිතිකම් කියන අය : සීමාසහිත සතිගම සමාගම, ජෝර්ජ් ස්ටුවට් සමාගම බාරේ, තැ. පෙ. 151, කොළඹ ; ප්‍රමාණය : අ. 54, රූ. 1, ප. 12.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩම්වලට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960 සැප්තැම්බර් මස 28 දින පෙරවරු 10ට කෑගල්ලේ කච්චේරියේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1960 සැප්තැම්බර් 21 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දන්වීමකින් මට ලියා දන්විය යුතුයයි ද නියම කරමි.

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
කෑගල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

කෑගල්ලේ කච්චේරිය,
1960 අගෝස්තු මස 17 දාය.

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## දීමනා පත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි

මෙහි පහත විස්තර දැක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනා පත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස කළුතර කච්චේරියේදී වර්ෂ 1960 ඔක්තෝබර් 24 වැනි දින පෙරවරු 9.30 ට ඉඩම් සශ්‍රීක කිරීමේ ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් කළුතර ආණ්ඩුවේ ඒජන්ත තුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. 1942 නො. 61කේ ඉඩම් නිදහස් කිරීමේ ආඥාපනතේ නො. 5 (1) වගන්තියේ සහ 1948 ඉඩම් නිදහස් කිරීමේ 3 වෙනි රෙගුලාසියෙන් සංශෝධිත ඉහත සඳහන් කළා වූ ආඥාපනතේ අන්තර්ගත වූ පළමු උප ලේඛනයෙහි සඳහන් සියලුම කොන්දේසිවලට එකී දීමනා පත්‍ර යටත් වේ.

3. ඉඩම් කට්ටි ලබාගනු කැමති සෑම අයෙක් විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනී සිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

4. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගත යුතු යමක් ඇතහොත් කළුතර ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් විමසිය යුතුයි.

අ. ච. ල. අභයසුන්දර,
සහකාර ඉඩම් කොමසාරිස් තුමා.

1960.8.16 දින.

දීමට යන ඉඩම්වල විස්තර :—

### කළුතර දිස්ත්‍රික්කය

සැලැස්මේ අංකය සහ ගම: ඇල්. ආර්. ඕ/ඒ. පී. ඇල් 1,565 මුල් සිතියම අ: 2,707, බොල්ගොඩ; කැබෙලි අංක: 1, 2, 3 සහ 4; අවසර පත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම: ඇම්. ඒබ්‍රහම් ප්‍රනාන්දු; ප්‍රමාණය: අ. 1, රූ. 0, ප. 23.1.

සැලැස්මේ අංකය සහ ගම: ඇල්. ආර්. ඕ/ඒ.පී.ඇල් 627, මුල් සිතියම 2,770, වැලිගම්පිටිය; කැබෙලි අංක: 1; අවසර පත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම: ඇම්. කේ. පී. පෙරේරා; ප්‍රමාණය: අ. 7, රූ. 0, ප. 0.

සැලැස්මේ අංකය සහ ගම: ඇල්. ආර්. ඕ/එ. පී. ඇල්. 1,441, මුල් සිතියම 3,506, මාලමුල්ල; කැබෙලි අංක: 1, 2; අවසර පත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම: කේ. ඕ. බාරොන් අප්පුහාමි; ප්‍රමාණය: අ. 2, රූ. 2, ප. 15.

---

## දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි

මෙහි පහත විස්තර දැක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස මාතර කච්චේරියේදී 1960 ඔක්තෝබර් මස 3 වෙනි දින පූර්වභාග 10ට 1935හේ අංක 19 දරන ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් මාතර ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

අයිවන් සමරවික්‍රම,
ඉඩම් කොමසාරිස්තැන වෙනුවට.

### දීමට යන ඉඩමේ විස්තර

ප්ලෑනේ අංකය හා ගම: අ. ග. සි. 10—වැලිවේ; කැබෙල්ලේ අංකය: 358; අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම: මිල්ලව පියදාස කරුණානායක, මිල්ල, මොරවක; ප්‍රමාණය: අ. 3, රූ. 3, ප. 34.

ප්ලෑනේ අංකය හා ගම: අ. ග. සි. 12—සියඹලාගොඩ; කැබෙල්ලේ අංකය: 374 හා 376; අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම: පියසේන ආරියදාස වීරසිංහ, අංක 2, කොතලාවල පෙදෙස, කොළඹ 4; ප්‍රමාණය: අ. 14, රූ. 3, ප. 07.

ප්ලෑනේ අංකය හා ගම: අ. ග. සි. 18—බෙන්ගමුව; කැබෙල්ලේ අංකය: 311 හා 312; අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම: සුගතදාස දොඩම්පෙ ගමගේ, උයන්වත්ත, මාතර; ප්‍රමාණය: අ. 2, රූ. 2, ප. 18.

ප්ලෑනේ අංකය හා ගම: අ. ග. සි. 23—ඌරුබොක්ක; කැබෙල්ලේ අංකය: 348; අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම: ආරියපාල කුරුනේරු, අංක 297/1, රවුම් පාර, මාගාල්ල, ගාල්ල; ප්‍රමාණය: අ. 11, රූ. 2, ප. 38.

ප්ලෑනේ අංකය හා ගම: අ. ග. සි. 26—බානගල; කැබෙල්ලේ අංකය: 179; අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම: හොරදුගොඩ ගමගේ හේමාවති, අංක 21, විකල් පටුමග, කොළඹ 8; ප්‍රමාණය: අ. 17, රූ. 3, ප. 01.

ප්ලෑනේ අංකය හා ගම: අ. ග. සි. 44—රොටුඹ; කැබෙල්ලේ අංකය: 317; අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම: දොන් සයිමන් ජයසිංහ, රොටුඹ, මාවරල; ප්‍රමාණය: අ. 4, රූ. 3, ප. 27.

ප්ලෑනේ අංකය හා ගම: අ. ග. සි. 170—පල්ලෙගම; කැබෙල්ලේ අංකය: 278 හා 297; අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම: දොන් බුඩදාස රත්වාගොඩ විජේසේකර, දෙමළියදොල් වත්ත, දෙනියාය; ප්‍රමාණය: අ. 24, රූ. 0, ප. 31.

**එකතුව: අ. 79, රූ. 3, ප. 36.**

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඇල්. කේ. 904.

## රජයේ ඉඩම් රෙගුලාසිවල 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කොළඹ ඉම්පීරියල් ලයිට් හවුස් සේවයේ අධිකාරිතැන, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම්පත්තුවේ කිරින්දේ පිහිටි ඇෆ්. වී. පී. 2 ඉන්සෙට් අංක 1 දරණ සිතියමේ, ලොට් නො. 89 දරණ ස්කේල ඉස් සරහ හේන්කැටිය කිරින්දගොඩන නැමැති රජයේ ඉඩම් කැබැල්ල පිළිබඳ බද්ද අලුත් කරන ලෙස ඉල්ලා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. 1959.1.1 දින සිට ඉල්ලුම්කරුට බදු දී ඇති මෙම ඉඩමේ ලයින් කාමර දෙකක් ඇත. අවසාන වරට දී තිබුන බද්ද 58. 12. 31 වැනි දින අවසාන විය. මේ සඳහා ඉඩම දිය හැක. එබැවින් රජයේ සෙසු කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසිවලටද යටත්ව බද්ද අලුත් කිරීමට අදහස් කර තිබේ.

(අ) මෙම බද්ද එක් පාර්ශයක් විසින් තුන්මසක් කල් දීමෙන් අවසාන කළ හැක.

(ආ) බදුකරු විසින් මෙම ස්ථානය යහපත් තත්ත්වයකින් හා පිරිසිදුවද තබා ගත යුතුය.

(ඉ) බදුකරු තමන්ගේම වියදමින් මෙහි ඇති කාමර, බදුදුන් දින තිබුනු තත්ත්වයෙන් පවත්වා ගත යුතුය.

(ඊ) බදුකරු මෙම කාමර පදිංචිය සඳහා පාවිච්චි කළ යුතුය.

(උ) බදුකරු ප්‍රසිද්ධ වැඩ අධ්‍යක්ෂක තැනගේ හෝ හම්බන්තොට සිටින ඔහුගේ නියෝජිත තැනගේ කැමැත්ත නැතුව හෝ එසේ ලබාගත් කැමැත්තට එකඟ නොවන සේ ඉඩමේ ඇති ගොඩනැගිල්ලෙහි නිර්මාණික වෙනස්කම් නොකළ යුතුයි.

(ඌ) ප්‍රසිද්ධ වැඩ අධ්‍යක්ෂක තැන හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් සාධාරණ කාලවේලා වලදී ඉල්ලා සිටිවිට කාමරවල සහ අවට භූමියේ ඕනෑම කොටසකට නිදහස් ලෙස ඇතුල්වීමට බදුකරු ඉඩදිය යුතුය.

(එ) බදුකරු බද්ද අවසානවූ විට කාමර සහ ඉඩම් නිසි පරිදි බලය ලත් රජයේ නියෝජිතයෙකුට භාරදිය යුතුය.

(ඒ) බදුකරු එක කාමරයකට කුලිය මාසයකට රු. 1.50 බැගින්, සෑම මාසයකම 10 වැනි දින හෝ ඊට පෙර හම්බන්තොට කච්චේරියට ගෙවිය යුතුය.

(ඔ) බදුකරු ඉහත සඳහන් (උ) සහ (එ) දරණ කොන්දේසි පිළිපැදීමේ ඇපය රු. 10ක් තැන්පත් කළ යුතුය. (උ) සහ (ඒ) යටතේ අයවිය යුතු මුදලක් ඇතොත් අඩුකරගෙන මෙම මුදල බද්ද අවසාන වී මාසයක් ඇතුළත දී ආපසු ගෙවනු ඇත.

(ඕ) බදුකරු (උ) සහ (එ) දරණ කොන්දේසි නොපිළිපැද්දොත්, බද්ද දීමේදී තිබුන තත්ත්වයට කාමර නැවත පත්කිරීමට අවශ්‍ය වන මුදල් ප්‍රමාණය ගෙවීමට බැඳී සිටී.

3. මෙදින සිට සති හයක් ඇතුළතදී ඊට විරුද්ධව සැහෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් මේ බද්ද දෙන්නෙමි.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට,

1960 අගෝස්තු මස 26 වැනි දින,
කොළඹ දීය.

ඇල්.ඇස්. 4564/ඇල්.ඇල්.ඩී/ඒ.374.

## 21 (2) වැනි ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකිඳ කොට්ඨාශයේ, දඹවිනිපලාත කෝරළේ හිඟුරුගමුවේ පිහිටි 74 දරණ අවසාන ගම් පිඹුරයේ අංක 82 දරණ ඉඩම් කට්ටියෙන් අක්කර 1/2 ක පමණ රජයේ ඉඩම් කැබැල්ලක් ගබඩාවක් සෑදීම පිණිස, හිඟුරුගමුව-ඇල්ලේගම විවිධ සේවා සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලුම් කර ඇති ඉඩම දීමට තිබේ. එසේම සෙසු කොන්දේසි වලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත්ව මෙම ඉඩම බදු දීමට යෝජනා කර ඇත.

(අ) කාලය: අවුරුදු 30 යි.

(ආ) බදුමුදල: වසරකට රු. 4 යි.

(ඉ) බදුකරු විසින් බද්ද ආරම්භ වූ වසරක් ඇතුළත බදුල්ලේ දිසාපතිගේ සිත් ගන්නා පරිද්දෙන් මෙම ඉඩමෙහි ගබඩාවක් තනා නිම කළ යුතුය.

(ඊ) බදු කරු විසින් මෙම ඉඩම ගබඩාවක් සෑදීම පිණිස යොදනවා විනා අන්‍ය කටයුත්තක් සඳහා නොයෙද විය යුතුයි.

3. මෙහි සඳහන් දින සිට සති හයක් ඇතුළත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළ හොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු මස 26 වැනි දින,
කොළඹ ඉඩම් කොමසාරිස් කාර්‍යාලයේ දී ය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.